**ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | උසභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට නොහැකි වූ රු.14,017,490 ක් වූ බෝක්කු,පාලම් හා ජල පද්ධතිවල වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කිරීමට වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | පිළිගන්නා බව. | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුමට බැර කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමට නොහැකි වූ ජල පිරිපහදු ඒකකයක් හා පිළිසරු මධ්‍යස්ථානයේ පොදු ළිඳක් ඉදිකිරීමේ ව්‍යාපෘතිවල රු.2,524,650ක් වූ වටිනාකම බෝක්කු හා පාලම් යටතේ දක්වා තිබුණි. | -එම- | නියමිත වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.14,000,000 ක් වූ ජල බවුසරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.16,029,847 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.10,422,698 ලෙස රු.5,607,140 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී අතිරික්තයේ ඌණතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.2,509,894 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීරණ ආදායම් යටතේ එය රු.2,864,533 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.2,509,594 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන ප්‍රදාන ලෙස දක්වා නොතිබුණි. | -එම- | පුනරාවර්තන නොවන ප්‍රදාන නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (උ) | 2021 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 04 කට අදාල බෝක්කු ඉදිකිරීම් වටිනාකම රු.2,587,404 ක් ගිණුම ගතකර නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන සහ දේපල පිරියත, උපකරණ නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි අතිරික්තයෙහි හෝ ඌණතාවයෙහි ඇතුලත් කර නොමැති ප්‍රාග්ධන වියදම් දීමනා රු.8,392,851ක් ද පූර්ව කාලපරිච්ඡේදයට අදාලව ප්‍රාග්ධන වියදම් දීමනා වැරදි නිවැරදි කිරීම් රු.14,017,490 ක්ද සමාලෝචිත වර්ෂයේ ආදායමේ හඳුනා ගැනීම් රු.25,069,894 ක් ද දක්වා නොතිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක අතරුදවුම් රු.40,113 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය අනුව වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය රු.22,110,010 ක් වුවත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැටුප් ප්‍රතිපූර්ණ පත්‍රිකාවල අනුව එය රු.21,928,304 ක් වුයෙන් රු.187,706 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය අනුව වාහන කුලී ආදායම රු.1,945,160 ක් වුවත් උපලේඛන අනුව එම ආදායම රු.1,673,680 ක් වූයෙන් රු.291,480 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) | වත්කම් සහ වගකීම් ප්‍රකාශය අනුව කඩකාමර කුලීය රු.419,995 ක් වුවත් ඊට අදාළ උපලේඛනය අනුව එය රු.409,995 ක් වූයෙන් රු.10,000 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපුම් ලෙස සඳහන් කර තිබෙන ලැබිය යුතු දැ වල අඩුවීම් රු.21,574,039 ක් සහ ගෙවිය යුතු දැ වල වැඩිවීම් රු.16,521,495 ක් ගණනය කළ ආකාරය හා ඊට අදාල ණයගැති හා ණයහිමි වටිනාකම් වලට ඇතුලත් ප්‍රාග්ධන වියදම්වල ණයගැතියන්, ණයහිමියන් ඉවත් කිරීම පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව. | තහවුරු කිරීම ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම්/ස්න්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි සමුච්චිත අතිරික්තය යටතේ පූර්ව කාලපරිච්ඡේදයේ වැරදි ලෙස සඳහන් රු.17,961,710 ක් ගණනය කළ ආකාරය පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම රු.11,895,596 ක් වූ ගිණුම් ශේෂ 10 ක් තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සඳහන් 2020 වර්ෂයේදී ඉදිකරන ලද වටිනාකම රු.5,111,926 ක් වූ බෝක්කු, පාලම කොන්ක්‍රීට් මාර්ග පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.25,424,762 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.27,545,544 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,656,827 | 2,702,644 | 2,922,213 | 5,463,776 | 2,516,727 | 2,859,504 | 1,474,449 | 5,683,345 |
| (ii) | කුලී | 10,142,350 | 6,471,310 | 5,473,490 | 1,729,805 | 2,404,000 | 1,913,050 | 1,462,140 | 731,985 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 820,000 | 779,250 | 576,500 | 376,500 | 912,000 | 969,505 | 795,755 | 173,750 |
| (iv) | වෙනත් ආදායම් | 17,494,300 | 10,233,633 | 14,477,380 | 4,169,197 | 23,879,750 | 17,862,453 | 9,840,853 | 8,412,944 |
| | | 31,113,477 | 20,186,837 | 23,449,583 | 11,739,278 | 29,712,477 | 23,604,512 | 13,573,197 | 15,002,024 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.5,107,976 ක හිඟ වරිපනම් අයවී නොතිබුණු අතර ඒකක 173 කින් ව්‍යාපාර බදු රු.355,800 ක්ද අයවී නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) **කුලී** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකුලී රු.1,066,805 ක් වසර 1- 2 අතර කාලයක සිට අයවී නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ii) | 2020 සහ 2021 වර්ෂවලදී සභාවේ යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් පාර්ශ්වයන් 11 කින් ලැබිය යුතු රු.663,000 ක් අයකර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට වෙළඳ බලපත්‍ර ආදායම රු.376,500 වසර 01- 02 අතර කාලයක සිට ක් අයවී නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.600,000 ක් හා මුද්දර ගාස්තු රු.2,160,150 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | -එම- | ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 මාර්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04 /2020 දරන ලිපිය ප්‍රකාරව සභාව සතු යන්ත්‍රෝපකරණ ණය පදනම මත කුලියට ලබාදීම් නොකළ යුතු වුවත් 2022 වර්ෂයේදී යන්ත්‍රෝපකරණ 03 ක් ණය පදනම මත ලබාදීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.663,000 ක් අයවී නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.424,198 ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ තුළ වසර 6 කට වඩා පැරණි රු.350,378 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ සභා බල ප්‍රදේශයේ ආදායම් උත්පාදනය සඳහා සමීක්ෂණ කිසිවක් සිදුකර නොතිබුණු අතර එම නිසා දැන්වීම් පුවරු කර්මාන්ත සහ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් රැස්කළ යුතු ආදායම් හඳුනාගෙන නොතිබුණි. | -එම- | ආදායම් හඳුනාගෙන රැස්කර ගත යුතුය. |
| (ඈ) | සභාව සතු මස්කඩ,ගෝසාතකාගාර හා මාළු ලැලි භෞතිකව නොමැතිව නාමිකව පමණක් වත්කම් බදුදීම නිසා සභාවට ලබා ගැනීමට හැකිව තිබුණු ආදායම් අහිමි වී තිබුණි. | -එම- | භෞතිකව වත්කම් නොමැතිව බදු දීම සිදු නොකළ යුතුය. |
| (ඉ) | සභාව සතු කඩකාමර 31 ක් වසර ගණනාවක සිට අළුත්වැඩියා කර වෙළදාම් සිදු කළ හැකි පරිදි අකාර්ශනිය ලෙස සකස් කර නොදීම නිසා සමාලෝචිත වර්ෂයේදී කඩකාමර 10 ක් කිසිදු පාර්ශවයක් විසින් කුලියට ලබාගෙන නොතිබුණි. | -එම- | මෙම කඩකාමර අළුත්වැඩියා කර කුලියට ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාවේ සේවය කරන නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම කාර්යාලයේ රැඳිසිටීම තහවුරු කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර හා CCTV කැමරා පද්ධති වැනි පාලන ක්‍රම ඇතිකර නොතිබුණි. | -එම- | නවීන තාක්ෂණ ක්‍රම යොදාගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු උපකරණවල වටිනාකම් හඳුනාගෙන බඩු වට්ටෝරු ලේඛණයට ඇතුලත් කර නොතිබුණි. | -එම- | බඩුවට්ටෝරු පොත් විධිමත් පරිදි පවත්වාගත යුතුය. |